වෙළුම 12 | කාණ්ඩය 01 | අප්‍රේල් 2023

# පුවත් හසුන

උක් පර්යේෂණ ආයතනය

# සීනි කර්මාන්තයේ ඇති අභියෝග ජය ගැනීමට ඒකාබද්ධ වැඩ පිළිවෙලක්



සාකච්ඡාව සඳහා සහභාගි වූ නිලධාරීන්ගෙන් කොටසක්

උක් පර්යේෂණ ආයතනය හා සීනි කර්මාන්තායතන එක්ව පවත්වන හමුව මෙවර වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ සුළු අපනයන වැවිලි බෝග සංවර්ධන අංශයේ සම්බන්ධීකරණයෙන් එම අංශයේ ශ්‍රවණාගාරයේ දී පැවැත්විණි. 2023 මාර්තු 21 දින පැවති මෙම හමුව අමාත්‍යංශ අතිරේක ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් පැවති අතර, සීනි කර්මාන්තායතන නියෝජනය කරමින් ලංකා සීනි සමාගම (සෙවනගල හා පැල්වත්ත), ඇතිමලේ වැවිලි සමාගම හා ගල්ඔය වැවිලි සමාගමේ ඉහළ පෙළේ නිලධාරීන් සහභාගී විය. උක් පර්යේෂණ ආයතනය වෙනුවෙන් එහි සභාපති, අධ්‍යක්ෂ ඇතුළු පර්යේෂණ කාර්යමණ්ඩලය ද මේ සඳහා එක් විය. මෙහිදී උක් කර්මාන්තයේ ඇති ප්‍රධාන පර්යේෂණ අවශ්‍යතා හඳුනා ගනිමින් ඒවාට ගැලපෙන පරිදි සියලු කර්මාන්තායතන සමගින් ඒකාබද්ධ පර්යේෂණ වැඩසටහන් සැකසීමටත්, උක් කර්මාන්තයේ ප්‍රමුඛතාවන් හා අපේක්ෂාවන් හඳුනා ගනිමින් ඒ අනුව තාක්ෂණයන් හා සේවා සැපයීමටත් තීරණය විය. දැනට උක් වගා ක්ෂේත්‍රයේ ගුණාත්මක යෙදවුම් ලබා ගැනීමේ දී මුහුණ දී ඇති ගැටලු සම්බන්ධව ද අවධානය යොමු කරමින් එම ගැටලු නිරාකරණය කර ගැනීමට අදාළ ආයතන සමග අමාත්‍යාංශ මට්ටමින් විසඳුම් ලබා ගැනීමටත් සාකච්ඡා විය. එමෙන්ම එතනෝල් ආනයනය සීමා කිරීමට ගෙන ඇති ප්‍රතිපත්තිමය තීරණයේ වෙනසක් වුවහොත් එය දේශීය සීනි කර්මාන්තයට ඇති කරන බලපෑම ගැනද අවධානය යොමු විය.

# නිෂ්පාදන වියදම අඩුකර ගැනීමට කාර්යක්ෂම උක් සිටුවීමේ තාක්ෂණයන් ප්‍රචලිත කරයි




උක් පර්යේෂණ ආයතනය විසින් උක් ගොවි ප්‍රජාව වෙත උක් සිටුවීමේ ක්‍රම කිහිපයක් හඳුන්වා දී ඇත. එම ක්‍රම මගින් හෙක්ටයාරයක බිම් ප්‍රමාණයක් සඳහා අවම බීජ උක් ප්‍රමාණයක් භාවිතා කරමින් ඉතා සාර්ථක උක් වගාවක් ස්ථාපිත කර ගත හැකිය.

මෙම බීජ සිටුවීමේ ක්‍රම භාවිතා කිරීම මගින් වගාව සංස්ථාපනයේ දී සැලකිය යුතු මුදලක් ද ඉතිරි කර ගැනීමේ හැකියාව ඇත. මෙම සිටුවීමේ ක්‍රම යොදාගනිමින්, ක්ෂේත්‍ර ආදර්ශන ස්ථාපිත කිරීමට තාක්ෂණ හුවමාරු හා සංවර්ධන අංශය පියවර ගෙන ඇති අතර, මේ යටතේ උඩවලව පර්යේෂණ ගොවිපොළෙහි හා සියඹලාණ්ඩුව ප්‍රදේශයේ ක්ෂේත්‍ර ආදර්ශන දෙකක් ස්ථාපිත කිරීමට කටයුතුකර ඇත. මෙම ක්ෂේත්‍ර ආදර්ශන යොදා ගනිමින් ඉදිරියේ දී ගොවි ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමට සැලසුම්කර ඇති අතර, එමගින් ගොවීන් මෙම ක්‍රමයන් භාවිතයට හුරු කිරීම අපේක්ෂාවයි.

06 පිටුවට

## ඇතුළු පිටු


- වාණිජ වගාවන් සඳහා ව්‍යාප්ත කිරීමට 2003 හා 2004 කාණ්ඩයේ උක් ප්‍රභේද හඳුනා ගැනේ 02
- බෝග පෝෂණ අංශයට ආචාර්ය උපාධියක් 02
- පර්යේෂණ සඳහා ඩ්‍රෝන තාක්ෂණය යොදා ගැනේ 03
- ගල්ඔය සීනි කර්මාන්තයේ ප්‍රාදේශීය විශේෂිතව පර්යේෂණ හා ව්‍යාප්ති වැඩසටහනක් 03
- උක් වගාවේ තාක්ෂණික දනුම ව්‍යාප්ත කිරීමේ වැඩසටහන් රැසක් 04-05
- මෙවර අතුරු-බෝග වගාවෙන් ගොවීන්ට වාසි 06
- සුළු පරිමාණ උක් හකුරු කර්මාන්තය නැංවීමට ව්‍යාවසායකයින් සඳහා එක්දින පුහුණුවක් 06
- නිෂ්පාදන වියදම අඩුකර ගැනීමට කාර්‍යක්ෂම උක් සිටුවීමේ තාක්ෂණයන් ප්‍රචලිත කරයි 06
- මෙහෙවර ඇස සීනි ක්ෂේත්‍රය වෙත යොමුවේ 07
- දේශීය උක් කර්මාන්තයේ ඉහළම එතනෝල් නිෂ්පාදනය 2022 වර්ෂයේ දී වාර්තා කරයි 07
- සීනි කර්මාන්තයේ කාර්යසාධනය 2017-2022 08


# වාණිජ වගාවන් සඳහා ව්‍යාප්ත කිරීමට සුදුසු 2003 හා 2004 කාණ්ඩයේ උක් ප්‍රභේද හඳුනා ගැනේ

2003 හා 2004 කාණ්ඩයේ උක් ප්‍රභේදවල ක්ෂේත්‍ර ඇගයීම් කටයුතු අවසන් කිරීමට හැකිවී තිබේ. මේ වන විට 2004 කාණ්ඩයේ උක් ප්‍රභේදවල දත්ත ලබාගෙන ඇති අතර, එම දත්ත විශ්ලේෂණයෙන් පසු වාණිජ වගාවන්ට සුදුසු ප්‍රභේද තෝරා ගැනීමට පියවර ගනු ඇත. සෙවනගල, පැල්වත්ත, ඇතිමලේ හා හිඟුරාන යන ප්‍රදේශවල ස්ථාපිත කරන ලද ප්‍රභේද මෙලෙස ඇගයීමට ලක් කළ අතර, 2023 වසර අවසන් වීමට ප්‍රථම එක් එක් ප්‍රදේශයට ගැලපෙන ප්‍රභේද වාණිජ වගාව සඳහා නිදහස් කිරීමට සැලසුම් කර ඇත.

02 පිටුවට

01 පිටුවෙන්

# වාණිජ වගාවන් සඳහා ව්‍යාප්ත කිරීමට සුදුසු 2003 හා 2004 කාණ්ඩයේ උක් ප්‍රභේද හඳුනා ගැනේ

සීනි කර්මාන්තායතනවල වගා අංශයේ නිලධාරීන් හා ප්‍රදේශයේ ගොවි නියෝජිතයන්ගේ සහයෝගයෙන් මෙම ඇගයීමේ කටයුතු සිදු කිරීමට පියවර ගෙන ඇත. උක් ප්‍රභේදයක තිබිය යුතු උසස් ලක්ෂණයන් වන කඳේ හා පත්‍රවල පෙනුම, කොළ ගැලවීම, බූව රහිත බව, පඳුරු දැමීම, රෝග හා පළිබෝධ ප්‍රතිරෝධීතාව, දියගොබ රහිත බව වැනි ලක්ෂණ ගණනාවක් ඔස්සේ නිරීක්ෂණ ලබා ගනිමින් ඇගයීම් කටයුතු සිදු කර ඇත.

මෙම ඇගයීම් කටයුතු සාර්ථක කර ගැනීම වෙනුවෙන් ලංකා සීනි සමාගමේ සෙවනගල හා පැල්වත්ත ඒකකයන්, ඇතිමලේ වැව්ලි සමාගම හා ගල්ඔය වැව්ලි සමාගම්වල ඉහළ  කළමනාකාරිත්වයේ හා සියලුම නිලධාරීන්ගේ නොමද සහයක් ලැබුණු අතර, එක් එක් ප්‍රදේශයේ ගොවි නියෝජිතයන් ද ඉතා උද්යෝගයෙන් මෙම වැඩසටහනට එක් වූ අයුරු දැක ගැනීමට හැකි විය. සියලු ඇගයීම්වල තොරතුරු විශ්ලේෂණයෙන් පසුව එක් එක් ප්‍රදේශයන්ට ගැලපෙන උක් ප්‍රභේද, වාණිජ වගාව සඳහා ඉතා කඩිනමින් හඳුන්වා දීමට උක් පර්යේෂණ ආයතනය විසින් මේ වන විට කටයුතු කරමින් පවතී.




ලංකා සීනි සමාගමේ සෙවනගල ඒකකයේ නිලධාරීන් විසින් 2003 ශ්‍රේණියේ උක් ප්‍රභේදවල ඇගයීම සිදු කරමින්




ඇතිමලේ වැව්ලි සමාගමේ නිලධාරීන් හා ගොවි නියෝජිතයින් විසින් 2004 ශ්‍රේණියේ උක් ප්‍රභේදවල ඇගයීම සිදු කරමින්




ලංකා සීනි සමාගමේ සෙවනගල ඒකකයේ නිලධාරීන් විසින් 2004 ශ්‍රේණියේ උක් ප්‍රභේදවල ඇගයීම සිදු කරමින්




ගල්ඔය වැව්ලි සමාගමේ නිලධාරීන් හා ගොවි නියෝජිතයින් විසින් 2004 ශ්‍රේණියේ උක් ප්‍රභේදවල ඇගයීම සිදු කරමින්




ලංකා සීනි සමාගමේ පැල්වත්ත ඒකකයේ නිලධාරීන් හා ගොවි නියෝජිතයින් විසින් 2004 ශ්‍රේණියේ උක් ප්‍රභේදවල ඇගයීම සිදු කරමින්

## බෝග පෝෂණ අංශයට ආචාර්ය උපාධියක්

බෝග පෝෂණ අංශයේ පර්යේෂණ නිලධාරී ආසිරි වීරසිංහ මහතා, 2022 දෙසැම්බර් මාසයේ දී පාංශු පෝෂණය සම්බන්ධයෙන් සිය ආචාර්ය උපාධිය සම්පූර්ණ කිරීමට සමත් විය. 2009 වර්ෂයේ පර්යේෂණ නිලධාරීවරයෙක් ලෙස සේවයට එක්වුණු ඒ මහතා මේ වන විට බෝග පෝෂණ අංශයේ කාර්යභාර පර්යේෂණ නිලධාරී ලෙස කටයුතු කරනු ලබයි. ආසිරි වීරසිංහ මහතා සිය මූලික උපාධිය ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයෙන් ලබාගෙන ඇති අතර, දර්ශනපති හා විද්‍යාපති උපාධි පේරාදෙණිය කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනයෙන් සම්පූර්ණ කිරීමට සමත්ව ඇත. පාංශු පෝෂණය සම්බන්ධයෙන් පර්යේෂණ රැසකටම තම දායකත්වය ලබා දී ඇති ආචාර්ය ආසිරි වීරසිංහ, 2012 හා 2014 පැවති වැව්ලි බෝග පර්යේෂණ සම්මන්ත්‍රණවල දී සීනි අංශය වෙනුවෙන් හොඳම පර්යේෂණ ඉදිරිපත් කිරීම වෙනුවෙන් වන සම්මානය දිනාගෙන ඇති අතර, 2014 දී ඉන්දියානු උක් පර්යේෂණ ආයතයේ පැවති සම්මන්ත්‍රණයක දී කෘෂිකර්ම අංශයෙන් ඉදිරිපත් කළ පර්යේෂණ පත්‍රිකාව, එම අංශයේ දී ප්‍රථම ස්ථානය හිමිකර ගැනීමට ද සමත් වී ඇත.



ආචාර්ය ආසිරි වීරසිංහ

# පර්යේෂණ සඳහා ඩ්‍රෝන තාක්ෂණය යොදා ගැනේ

ආචාර්ය තිලංක ආරියවංශ - පර්යේෂණ නිලධාරී

ශ්‍රී ලංකාවේ උක් කර්මාන්තයේ විප්ලවීය වෙනසක් ඇති කිරීම අරමුණු කර, උක් ක්ෂේත්‍රයේ විවිධ අභියෝගවලට මුහුණ දීම සඳහා ඩ්‍රෝන තාක්ෂණයේ බලය උපයෝගී කර ගනිමින් පර්යේෂණ පැවැත්වීමට උක් පර්යේෂණ ආයතනය මේ වන විට කටයුතු කරමින් ඇත. යාන්ත්‍රිකරණ තාක්ෂණ අංශය, බෝග පෝෂණ අංශය, බෝග ආරක්ෂණ අංශය, බෝග වැඩිදියුණු කිරීමේ අංශය සහ බෝග හා සම්පත් කළමනාකරණ අංශය සමග එක්ව මෙම පර්යේෂණ දියත් කිරීමට පියවර ගෙන ඇත.

මෙම පර්යේෂණය මගින් නයිට්‍රජන් භාවිතය හඳුනා ගැනීම, උක් අස්වැන්න පිළිබඳ පුරෝකථනය සහ සුදු පත්‍ර රෝගය (WLD) කල්තියා හඳුනා ගැනීම සඳහා ඩ්‍රෝන යානා යෙදීම, විවිධ භූමි සැකැස්ම සමඟ යන්ත්‍ර භාවිතයේ කාර්යක්ෂමතාව හඳුනා ගැනීමට සැලසුම්කර ඇත. බහු වර්ණාවලි රූපකරණය උපයෝගී කර ගනිමින් උඩවලවේ, ඇතිමලේ (ඇතිමලේ වැවිලි සමාගමේ සහයෝගීතාව ඇතිව), හිඟුරාන (ගල්ඔය වැවිලි සමාගමේ සහයෝගීතාව ඇතිව), පැල්වත්ත, සහ සෙවනගල (ලංකා සීනි සමාගමේ සහයොගීතාව ඇතිව) උක් වගාවන්හි පුළුල් ලෙස දත්ත රැස් කරමින් පර්යේෂණය සඳහා අවශ්‍ය දත්ත ලබා ගැනීමට මේ වන විට කටයුතු කරමින් සිටී.



විශාල දත්ත (Big data), යන්ත්‍ර ඉගෙනීම (Machine Learning) සහ ගැඹුරු ඉගෙනුම (Deep Learning), ඇල්ගොරිතම මෙම පර්යේෂණයේ තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරනු ඇත. බහු වර්ණාවලි දත්ත සහ එකතු කරන ලද භූමි දත්ත අතර, අර්ථවත් සබඳතා ගොඩ නැගීමටත්, ශ්‍රී ලංකාවේ සීනි කර්මාන්තය තුළ සම්පත් ප්‍රශස්ත කිරීම සහ චක්‍රලේඛ ආර්ථික (Circular Economy) සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා ස්මාර්ට් නිරවද්‍ය කෘෂිකාර්මික තාක්ෂණයන් (Smart Precision Agricultural Technology) යෙදීම සඳහා සාක්ෂි පදනම් කරගත් මාර්ගෝපදේශ සංවර්ධනය කිරීමත් මෙම පර්යේෂණය මගින් අපේක්ෂා කෙරේ. පර්යේෂණයේ ප්‍රතිඵල මගින් ගොවීන්ට, ව්‍යාපාරවලට සහ පරිසරයට වඩාත් තිරසාර හා කාර්යක්ෂම ප්‍රතිලාභ ලබා දෙන අනාගතයකට මග පාදනු ඇත.

# ගල්ඔය සීනි කර්මාන්තයේ ප්‍රාදේශීය විශේෂිතව පර්යේෂණ හා ව්‍යාප්ති වැඩසටහනක්



නිලධාරීන් සාකච්ඡාවට සහභාගී වෙමින්

ගල්ඔය වැවිලි සමාගම, සිය වගා, සීනි සහ අනෙකුත් අතුරු නිෂ්පාදන කටයුතු වඩාත් පුළුල් කරමින් සිටී. වර්තමානයේ, එම කාර්යයන්ගේ කාර්යක්ෂමතාව සහ ඵලදායීතාවට සෘජුවම බලපාන ගැටලු කිහිපයකට පර්යේෂණාත්මක විසඳුම් අවශ්‍ය වි ඇති අතර, එම තත්වය මත, සමාගම විසින් උක් පර්යේෂණ ආයතනයෙන් සිදුකරන ලද ඉල්ලීමකට අනුව, ඒවාට කඩිනම් ක්‍රියාමාර්ග ගැනීමේ අරමුණින්, දෙපාර්ශවයේ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් සාකාච්ඡාවක් පසුගිය දා ගල්ඔය වැවිලි සමාගම් ශ්‍රවණාගාරයේ දී පැවැත්වූ අතර, එහි දී පහත තීරණයන්ට එළඹින.

- ගල්ඔය වැවිලි සමාගමට අයත් ප්‍රදේශවල ප්‍රධාන වශයෙන් වගාකරන උක් ප්‍රභේදයන්හි ප්‍රාදේශීය අනුවර්තීතාව සහ මේරීමේ රටාව පරීක්ෂා කිරීම.
- ප්‍රදේශයේ පවතින විවිධ පාංශු කාණ්ඩ/කලාප සඳහා වෙන් වෙන් වශයෙන් මෙන්ම, ක්ෂේත්‍ර විශේෂිත පොහොර නිර්දේශ ලබාදීම.
- ජල සම්පාදනයේ දී පවතින ගැටලුවලට විසඳුමක් වශයෙන්, එක් එක් ප්‍රදේශ සඳහා විශේෂිත වූ ජල සම්පාදන කාල පරාසයන් නිර්ණය කිරීම.
- රෝග හා පලිබෝධ පැතිරීම් (Outbreak) කල්තියා පුරෝකථනය කළ හැකි ක්‍රමවේදයක් සැකසීම.
- ප්‍රදේශයට උචිතවන කුඩා පරිමාණ යන්ත්‍රෝපකරණ සංවර්ධනය/හඳුන්වාදීම සහ දැනට පවත්නා දෑ, නිසි ක්‍රමවේදයකින් ක්ෂේත්‍ර ඇගයීමකට ලක්කොට නිර්දේශ ලබා දීම.

මෙම කාර්යයන්ට අදාළ පර්යේෂණ ක්ෂේත්‍ර ස්ථාපනය කිරීම, නඩත්තුව හා අදාළ දත්ත ලබාගැනීම සඳහා ගල්ඔය වැවිලි සමාගමෙහි ශෂ්‍ය විද්‍යා අංශය සහ උක් වගා සංවර්ධන නිලධාරී කාර්යාලය යටතේ ක්‍රියාත්මකවන කණ්ඩායමක් පත්කිරීමටත් එම කණ්ඩායමට විශේෂිත පුහුණුවක් ලබාදීමටත් තීරණය විය. උක්ත කාර්යයන්හට ප්‍රමුඛතාව ලබා දී, උක් පර්යේෂණ ආයතනයේ සහ ගල්ඔය වැවිලි සමාගමේ එකාබද්ධ මෙහෙයවීමෙන් කඩිනමින් නිර්දේශ ලබා දීමට එකඟතාවය පළ විය.

උක් පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂතුමාගේ උපදෙස් අනුව තාක්ෂණ හුවමාරු සහ සංවර්ධන අංශයේ සම්බන්ධීකරණයෙන් පැවති මෙම සාකච්ඡාවට, එම ආයතනය වෙනුවෙන්, බෝග හා සම්පත් කළමනාකරණ, බෝග පෝෂණ, යාන්ත්‍රිකරණ තාක්ෂණ හා ආර්ථික විද්‍යා, ජෛවමිතික සහ තොරතුරු තාක්ෂණ යන පර්යේෂණ අංශවල පර්යේෂණ නිලධාරීන් මෙන්ම, ගල්ඔය වැවිලි සමාගම වෙනුවෙන් එහි ප්‍රධාන විධායක නිලධාරී ඇතුලු වගා අංශයේ නිලධාරීන් පිරිසක් සහභාගී විය.

# මෙවර අතුරු බෝග වගාවෙන් ගොවීන්ට වාසි



හිඟුරාන ප්‍රදේශයේ ස්ථාපිත අතුරුබෝග වගාවක්



2022/2023 මහ කන්නය වෙනුවෙන් උක් පර්යේෂණ ආයතනය විසින් අතුරු-බෝග ක්ෂේත්‍ර ආදර්ශන සඳහා නොමිලයේ බීජ බෙදා දීම සිදු කළ අතර, එමගින් ගොවීන් විසින් පවත්වාගෙන ආ ක්ෂේත්‍ර ආදර්ශන මගින් ඉතා හොඳ අස්වැන්නක් ලබා ගෙන ඇති ආකාරය නිරීක්ෂණය කළ හැකි විය.

සෙවනගල ප්‍රදේශයේ තෝරාගත් ගොවීන් 25ක් , සියඹලාණ්ඩුව ප්‍රදේශයේ ගොවීන් 15ක් හා හිඟුරාන ප්‍රදේශයේ තෝරාගත් ගොවීන් පිරිසකට පසුගිය කන්නයේ මෙසේ ක්ෂේත්‍ර ආදර්ශන සඳහා බීජ බෙදා දීම සිදු කරන ලදී.

# සුළු පරිමාණ උක් හකුරු කර්මාන්තය නැංවීමට ව්‍යවසායකයින් සඳහා එක්දින පුහුණුවක්

ශ්‍රී ලංකාව තුළ මේ වන විට පිරිසිදු උක් හකුරු හා උක් පැණි වෙනුවෙන් ඉහළ ඉල්ලුමක් නිර්මාණය වී තිබේ. එබැවින් මෙම නිෂ්පාදනයන් පිළිබඳ බොහෝ ව්‍යාවසායකයන්ගේ අවධානය දිනා ගැනීමට සමත්ව ඇත. මේ නිසාම 2023 වර්ෂය ආරම්භයත් සමග උක් හකුරු හා පැණි නිෂ්පාදනය සම්බන්ධ පුහුණුවක් ලබා ගැනීමට ව්‍යවසායකයන් කිහිප දෙනෙක්ම උක් පර්යේෂණ ආයතනයෙන් ඉල්ලීම් කර තිබුණි. ඒ අනුව 2023 ජනවාරි 10 දින වර්තමානයේ ඉතා සක්‍රිය ව්‍යාවසායකයන් සිව්දෙනෙක් සඳහා උක් හකුරු හා පැණි නිෂ්පාදනය සම්බන්ධ එක්දින පුහුණුවක් නොමිලයේ ලබා දීමට කටයුතු කර ඇත.

මෙම පුහුණු වැඩසටහන තාක්‍ෂණ හුවමාරු හා සංවර්ධන අංශය විසින් සංවිධානය කළ අතර, සැකසුම් තාක්‍ෂණ අංශය විසින් ඊට අදාළ පුහුණුව ඔවුන් වෙත ලබා දෙන ලදී.

වැඩසටහන අවසානයේ වටිනා සහතික පත්‍රයක්ද ඔවුන් වෙත පිරිනමන ලදී.



ප්‍රායෝගික පුහුණුව ලබන ව්‍යවසායකයින් පිරිස

01 පිටුවෙන්

# නිෂ්පාදන වියදම අඩුකර ගැනීමට කාර්‍යක්‍ෂම උක් සිටුවීමේ තාක්‍ෂණයන්...

විවිධ සිටුවීමේ ක්‍රම භාවිතා කිරීමේ දී අවශ්‍යවන උක් දඬු ප්‍රමාණයේ පැහැදිලි වෙනසක් දැක ගැනීමට හැකි විය.

| සිටුවීමේ ක්‍රමය | අවශ්‍ය උක් දඬු ප්‍රමාණය |
|---|---|
| දෙපේළි ක්‍රමය | ටොන් 12 - 13 |
| 50% අතිපිහිත ක්‍රමය | ටොන් 08 - 09 |
| තනි පේළි ක්‍රමය | ටොන් 06 - 07 |
| පරතරයක් ඇතිව සිටුවීමේ ක්‍රමය | ටොන් 03 - 04 |
| ඉනිමන් ක්‍රමය | ටොන් 03 - 04 |
| සාම්ප්‍රදායික ක්‍රමය/ උක් දණ්ඩම භාවිතා කිරීම | ටොන් 13 - 14 |

හෙක්ටයාරයක බිම් ප්‍රමාණයක් සඳහා උක් ටොන් 12 - 14ක් වැනි අසීමිත බීජ උක් ප්‍රමාණයක් භාවිතා කිරීමට සාම්ප්‍රදායිකව ගොවීන් හුරුවී සිටිති. මෙහිදී මීටරයක් සඳහා උක් දඬු දෙකකට වඩා භාවිතා කිරීම නිසා අධික බීජ උක් ප්‍රමාණයක් වැයවීම සිදුවේ.

නමුත් මෙලෙස වැයවන බීජ උක් ප්‍රමාණය 75%කින් පමණ අඩුකර ගැනීමටත් එමගින් රුපියල් 80,000ක පමණ මුදලක් ඉතිරි කර ගැනීමටත්, පරතරයක් ඇතිව සිටුවීමේ වැනි ක්‍රම භාවිතයෙන් හැකියාව ලැබෙනු ඇත. විශේෂයෙන් සෙවනගල වාරිපෝෂිත හා හිඟුරාන වැනි ප්‍රදේශවල මෙම පරතරයක් ඇතිව සිටුවීමේ ක්‍රමය ඉතා පහසුවෙන් යොදා ගනිමින් නිරෝගිමත් උක් වගාවක් මෙන්ම වැඩි අස්වැන්නක් ද ලබා ගැනීමේ හැකියාව ඇත.

එබැවින් අඩු බීජ උක් ප්‍රමාණයක් භාවිතා කරමින් වැඩි අස්වැන්නක් ලබා ගැනීමට හැකි බීජ සිටුවීමේ ක්‍රම භාවිතයට ගැනීමෙන් කාලයක්, ශ්‍රමයත්, මුදලුත් ඉතිරිකර ගැනීමට ඔබට හැකියාව ලැබෙනු ඇත.



# පර්යේෂණ සඳහා ඩ්‍රෝන තාක්‍ෂණය යොදා ගැනේ

ආචාර්ය තිලංක ආරියවංශ - පර්යේෂණ නිලධාරී

ශ්‍රී ලංකාවේ උක් කර්මාන්තයේ විප්ලවීය වෙනසක් ඇති කිරීම අරමුණු කර, උක් ක්ෂේත්‍රයේ විවිධ අභියෝගවලට මුහුණ දීම සඳහා ඩ්‍රෝන තාක්‍ෂණයේ බලය උපයෝගී කර ගනිමින් පර්යේෂණ පැවැත්වීමට උක් පර්යේෂණ ආයතනය මේ වන විට කටයුතු කරමින් ඇත. යාන්ත්‍රිකරණ තාක්ෂණ අංශය, බෝග පෝෂණ අංශය, බෝග ආරක්‍ෂණ අංශය, බෝග වැඩිදියුණු කිරීමේ අංශය සහ බෝග හා සම්පත් කළමනාකරණ අංශය සමග එක්ව මෙම පර්යේෂණ දියත් කිරීමට පියවර ගෙන ඇත.

මෙම පර්යේෂණය මගින් නයිට්‍රජන් භාවිතය හඳුනා ගැනීම, උක් අස්වැන්න පිළිබඳ පුරෝකථනය සහ සුදු පත්‍ර රෝගය (WLD) කල්තියා හඳුනා ගැනීම සඳහා ඩ්‍රෝන යානා යෙදීම, විවිධ භූමි සැකැස්ම සමග යන්ත්‍ර භාවිතයේ කාර්යක්‍ෂමතාව හඳුනා ගැනීමට සැලසුම්කර ඇත. බහු වර්ණාවලි රූපකරණය උපයෝගී කර ගනිමින් උඩවලවේ, ඇතිමලේ (ඇතිමලේ වැවිලි සමාගමේ සහයෝගීතාව ඇතිව), හිඟුරාන (ගල්ඔය වැවිලි සමාගමේ සහයෝගීතාව ඇතිව), පැල්වත්ත, සහ සෙවනගල (ලංකා සීනි සමාගමේ සහයොගීතාව ඇතිව) උක් වගාවන්හි පුළුල් ලෙස දත්ත රැස් කරමින් පර්යේෂණය සඳහා අවශ්‍ය දත්ත ලබා ගැනීමට මේ වන විට කටයුතු කරමින් සිටී.



විශාල දත්ත (Big data), යන්ත්‍ර ඉගෙනීම (Machine Learning) සහ ගැඹුරු ඉගෙනුම (Deep Learning), ඇල්ගොරිතම මෙම පර්යේෂණයේ තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරනු ඇත. බහු වර්ණාවලි දත්ත සහ එකතු කරන ලද භූමි දත්ත අතර, අර්ථවත් සබඳතා ගොඩ නැගීමටත්, ශ්‍රී ලංකාවේ සීනි කර්මාන්තය තුළ සම්පත් ප්‍රශස්ත කිරීම සහ චක්‍රලේඛ ආර්ථික (Circular Economy) සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා ස්මාර්ට් නිරවද්‍ය කෘෂිකාර්මික තාක්‍ෂණයන් (Smart Precision Agricultural Technology) යෙදීම සඳහා සාක්ෂි පදනම් කරගත් මාර්ගෝපදේශ සංවර්ධනය කිරීමත් මෙම පර්යේෂණය මගින් අපේක්‍ෂා කෙරේ. පර්යේෂණයේ ප්‍රතිඵල මගින් ගොවීන්ට, ව්‍යාපාරවලට සහ පරිසරයට වඩාත් තිරසාර හා කාර්යක්ෂම ප්‍රතිලාභ ලබා දෙන අනාගතයකට මග පාදනු ඇත.



නිලධාරීන් සාකච්ඡාවට සහභාගී වෙමින්

# ගල්ඔය සීනි කර්මාන්තයේ ප්‍රාදේශීය විශේෂිතව පර්යේෂණ හා ව්‍යාප්ති වැඩසටහනක්

ගල්ඔය වැවිලි සමාගම, සිය වගා, සීනි සහ අනෙකුත් අතුරු නිෂ්පාදන කටයුතු වඩාත් පුළුල් කරමින් සිටී. වර්තමානයේ, එම කාර්යයන්ගේ කාර්යක්ෂමතාව සහ ඵලදායීතාවට සෘජුවම බලපාන ගැටලු කිහිපයකට පර්යේෂණාත්මක විසඳුම් අවශ්‍ය වි ඇති අතර, එම තත්වය මත, සමාගම විසින් උක් පර්යේෂණ ආයතනයෙන් සිදුකරන ලද ඉල්ලීමකට අනුව, ඒවාට කඩිනම් ක්‍රියාමාර්ග ගැනීමේ අරමුණින්, දෙපාර්ශවයේ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් සාකාච්ඡාවක් පසුගිය දා ගල්ඔය වැවිලි සමාගම් ශ්‍රවණාගාරයේ දී පැවැත්වූ අතර, එහි දී පහත තීරණයන්ට එළඹින.

■ ගල්ඔය වැවිලි සමාගමට අයත් ප්‍රදේශවල ප්‍රධාන වශයෙන් වගාකරන උක් ප්‍රභේදයන්හි ප්‍රාදේශීය අනුවර්තීතාව සහ මේරීමේ රටාව පරීක්ෂා කිරීම.

■ ප්‍රදේශයේ පවතින විවිධ පාංශු කාණ්ඩ/කලාප සඳහා වෙන් වෙන් වශයෙන් මෙන්ම, ක්ෂේත්‍ර විශේෂිත පොහොර නිර්දේශ ලබාදීම.

■ ජල සම්පාදනයේ දී පවතින ගැටලුවලට විසඳුමක් වශයෙන්, එක් එක් ප්‍රදේශ සඳහා විශේෂිත වූ ජල සම්පාදන කාල පරාසයන් නිර්ණය කිරීම.

■ රෝග හා පලිබෝධ පැතිරීම් (Outbreak) කල්තියා පුරෝකථනය කළ හැකි ක්‍රමවේදයක් සැකසීම.

■ ප්‍රදේශයට උචිතවන කුඩා පරිමාණ යන්ත්‍රෝපකරණ සංවර්ධනය/හඳුන්වාදීම සහ දැනට පවත්නා දෑ, නිසි ක්‍රමවේදයකින් ක්ෂේත්‍ර ඇගයීමකට ලක්කොට නිර්දේශ ලබා දීම.

මෙම කාර්යයන්ට අදාළ පර්යේෂණ ක්ෂේත්‍ර ස්ථාපනය කිරීම, නඩත්තුව හා අදාළ දත්ත ලබාගැනීම සඳහා ගල්ඔය වැවිලි සමාගමෙහි ශෂ්‍ය විද්‍යා අංශය සහ උක් වගා සංවර්ධන නිලධාරි කාර්යාලය යටතේ ක්‍රියාත්මකවන කණ්ඩායමක් පත්කිරීමටත් එම කණ්ඩායමට විශේෂිත පුහුණුවක් ලබාදීමටත් තීරණය විය. උක්ත කාර්යයන්හට ප්‍රමුඛතාව ලබා දී, උක් පර්යේෂණ ආයතනයේ සහ ගල්ඔය වැවිලි සමාගමේ එකාබද්ධ මෙහෙයවීමෙන් කඩිනමින් නිර්දේශ ලබා දීමට එකඟතාවය පළ විය.

උක් පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂතුමාගේ උපදෙස් අනුව තාක්ෂණ හුවමාරු සහ සංවර්ධන අංශයේ සම්බන්ධීකරණයෙන් පැවති මෙම සාකච්ඡාවට, එම ආයතනය වෙනුවෙන්, බෝග හා සම්පත් කළමනාකරණ, බෝග පෝෂණ, යාන්ත්‍රිකරණ තාක්ෂණ හා ආර්ථික විද්‍යා, ජෛවමිතික සහ තොරතුරු තාක්‍ෂණ යන පර්යේෂණ අංශවල පර්යේෂණ නිලධාරීන් මෙන්ම, ගල්ඔය වැවිලි සමාගම වෙනුවෙන් එහි ප්‍රධාන විධායක නිලධාරි ඇතුලු වගා අංශයේ නිලධාරීන් පිරිසක් සහභාගී විය.

# මෙවර අතුරු බෝග වගාවෙන් ගොවීන්ට වාසි



හිඟුරාන ප්‍රදේශයේ ස්ථාපිත අතුරුබෝග වගාවක්

2022/2023 මහ කන්නය වෙනුවෙන් උක් පර්යේෂණ ආයතනය විසින් අතුරු-බෝග ක්ෂේත්‍ර ආදර්ශන සඳහා නොමිලයේ බීජ බෙදා දීම සිදු කළ අතර, එමගින් ගොවීන් විසින් පවත්වාගෙන ආ ක්ෂේත්‍ර ආදර්ශන මගින් ඉතා හොඳ අස්වැන්නක් ලබා ගෙන ඇති ආකාරය නිරීක්ෂණය කළ හැකි විය.



සෙවනගල ප්‍රදේශයේ තෝරාගත් ගොවීන් 25ක් , සියඹලාණ්ඩුව ප්‍රදේශයේ ගොවීන් 15ක් හා හිඟුරාන ප්‍රදේශයේ තෝරාගත් ගොවීන් පිරිසකට පසුගිය කන්නයේ මෙසේ ක්ෂේත්‍ර ආදර්ශන සඳහා බීජ බෙදා දීම සිදු කරන ලදී.

# සුළු පරිමාණ උක් හකුරු කර්මාන්තය නැංවීමට ව්‍යවසායකයින් සඳහා එක්දින පුහුණුවක්

ශ්‍රී ලංකාව තුළ මේ වන විට පිරිසිදු උක් හකුරු හා උක් පැණි වෙනුවෙන් ඉහළ ඉල්ලුමක් නිර්මාණය වී තිබේ. එබැවින් මෙම නිෂ්පාදනයන් පිළිබඳ බොහෝ ව්‍යාවසායකයන්ගේ අවධානය දිනා ගැනීමට සමත්ව ඇත. මේ නිසාම 2023 වර්ෂය ආරම්භයත් සමග උක් හකුරු හා පැණි නිෂ්පාදනය සම්බන්ධ පුහුණුවක් ලබා ගැනීමට ව්‍යවසායකයන් කිහිප දෙනෙක්ම උක් පර්යේෂණ ආයතනයෙන් ඉල්ලීම් කර තිබුණි. ඒ අනුව 2023 ජනවාරි 10 දින වර්තමානයේ ඉතා සක්‍රිය ව්‍යාවසායකයන් සිව්දෙනෙක් සඳහා උක් හකුරු හා පැණි නිෂ්පාදනය සම්බන්ධ එක්දින පුහුණුවක් නොමිලයේ ලබා දීමට කටයුතු කර ඇත.

මෙම පුහුණු වැඩසටහන තාක්ෂණ හුවමාරු හා සංවර්ධන අංශය විසින් සංවිධානය කළ අතර, සැකසුම් තාක්ෂණ අංශය විසින් ඊට අදාළ පුහුණුව ඔවුන් වෙත ලබා දෙන ලදී.

වැඩසටහන අවසානයේ වටිනා සහතික පත්‍රයක්ද ඔවුන් වෙත පිරිනමන ලදී.



ප්‍රායෝගික පුහුණුව ලබන ව්‍යවසායකයින් පිරිස

01 පිටුවෙන්

# නිෂ්පාදන වියදම අඩුකර ගැනීමට කාර්යක්ෂම උක් සිටුවීමේ තාක්ෂණයන්...

විවිධ සිටුවීමේ ක්‍රම භාවිතා කිරීමේ දී අවශ්‍යවන උක් දඬු ප්‍රමාණයේ පැහැදිලි වෙනසක් දැක ගැනීමට හැකි විය.

| සිටුවීමේ ක්‍රමය | අවශ්‍ය උක් දඬු ප්‍රමාණය |
|---|---|
| දෙපේලි ක්‍රමය | ටොන් 12 - 13 |
| 50% අතිපිහිත ක්‍රමය | ටොන් 08 - 09 |
| තනි පේලි ක්‍රමය | ටොන් 06 - 07 |
| පරතරයක් ඇතිව සිටුවීමේ ක්‍රමය | ටොන් 03 - 04 |
| ඉනිමන් ක්‍රමය | ටොන් 03 - 04 |
| සාම්ප්‍රදායික ක්‍රමය/ උක් දණ්ඩම භාවිතා කිරීම | ටොන් 13 - 14 |

හෙක්ටයාරයක බිම් ප්‍රමාණයක් සඳහා උක් ටොන් 12 - 14ක් වැනි අසීමිත බීජ උක් ප්‍රමාණයක් භාවිතා කිරීමට සාම්ප්‍රදායිකව ගොවීන් හුරුවී සිටිති. මෙහිදී මීටරයක් සඳහා උක් දඬු දෙකකට වඩා භාවිතා කිරීම නිසා අධික බීජ උක් ප්‍රමාණයක් වැයවීම සිදුවේ.

නමුත් මෙලෙස වැයවන බීජ උක් ප්‍රමාණය 75%කින් පමණ අඩුකර ගැනීමටත් එමගින් රුපියල් 80,000ක පමණ මුදලක් ඉතිරි කර ගැනීමටත්, පරතරයක් ඇතිව සිටුවීමේ වැනි ක්‍රම භාවිතයෙන් හැකියාව ලැබෙනු ඇත.

විශේෂයෙන් සෙවනගල වාරිපෝෂිත හා හිඟුරාන වැනි ප්‍රදේශවල මෙම පරතරයක් ඇතිව සිටුවීමේ ක්‍රමය ඉතා පහසුවෙන් යොදා ගනිමින් නිරෝගිමත් උක් වගාවක් මෙන්ම වැඩි අස්වැන්නක් ද ලබා ගැනීමේ හැකියාව ඇත.

එබැවින් අඩු බීජ උක් ප්‍රමාණයක් භාවිතා කරමින් වැඩි අස්වැන්නක් ලබා ගැනීමට හැකි බීජ සිටුවීමේ ක්‍රම භාවිතයට ගැනීමෙන් කාලයක්, ශ්‍රමයත්, මුදලුත් ඉතිරිකර ගැනීමට ඔබට හැකියාව ලැබෙනු ඇත.

# මෙහෙවර

## ඇස සීනි ක්ෂේත්‍රය වෙත යොමුවේ



ආචාර්ය එම්. එම්. පෙරේරා අදහස් දක්වමින්



දිනේශ් කොඩිතුවක්කු මහතා අදහස් දක්වමින්

2023 අප්‍රේල් 10 දින ස්වර්ණවාහිනියේ විකාශනය වූ "මෙහෙවර" වැඩසටහන තුළින් සීනි කර්මාන්තයේ උන්නතිය වෙනුවෙන් උක් පර්යේෂණ ආයතනයේ කාර්යභාරය පිළිබඳ සාකච්ඡා කරන ලද අතර, මේ සඳහා උක් පර්යේෂණ ආයතනය වෙනුවෙන් එහි අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී ආචාර්ය එම්. එස්. පෙරේරා සමගින් ආර්ථික විද්‍යා, ජෛවමිතික හා තොරතුරු තාක්ෂණ අංශයේ අංශ ප්‍රධානී, ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී දිනේශ් කොඩිතුවක්කු මහතා සහභාගී විය.

# දේශීය උක් කර්මාන්තයේ ඉහළම එතනෝල් නිෂ්පාදනය 2022 වර්ෂයේ දී වාර්තා කරයි

දිනේශ් කොඩිතුවක්කු - ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී

*2022 වර්ෂය තුළ ශ්‍රී ලංකාවේ උක් කර්මාන්තයේ කාර්යසාධනය සලකා බැලීමේ දී ඉතිහාසයේ උක් කර්මාන්තය පදනම් කරගත් ඉහළම එතනෝල් නිෂ්පාදනය, එනම් ලීටර් මිලියන 21.63ක් 2022 වර්ෂයේ දී වාර්තා කර ඇත. එය 2021 වර්ෂයේ නිෂ්පාදනය හා සැසඳීමේ දී 7.5%ක වැඩි වීමකි. ඒ සඳහා ප්‍රධාන වශයෙන් බලපා ඇත්තේ අලුතෙන් එතනෝල් නිෂ්පාදනයට එක් වූ ඇතිමලේ සීනි සමාගමේ එතනෝල් නිෂ්පාදනයයි.*


ඇතිමලේ වැව්ලි සමාගමේ එතනෝල් නිෂ්පාදන ඒකකය

2022 වර්ෂයේ මුළු සීනි නිෂ්පාදන ප්‍රමාණය 2021 වසර හා සසඳන කළ 3.4%ක පමණ අඩු වීමක් දක්නට ලැබුණ ද ගල්ඔය හා ඇතිමලේ සීනි කර්මාන්තශාලා තම උක් ඇඹරුම් ප්‍රමාණය මෙන්ම සීනි නිපැයුම් ප්‍රමාණයන් ද ඉහළ නංවා ගැනීමට සමත් වී ඇත. සෙවනගල හා පැල්වත්ත කර්මාන්තශාලාවලට අයත් ප්‍රදේශවල උක් වලින් යම් ප්‍රමාණයක් පිළිවෙලින් ගල්ඔය හා ඇතිමලේ කර්මාන්තශාලාවල ඇඹරීම ද මේ සඳහා හේතු වන්නට ඇත. සියලුම කර්මාන්තශාලාවලට අයත් ප්‍රදේශවල සාමාන්‍ය උක් අස්වැන්න 2021 වසරට වඩා අඩුවී ඇති අතර, වර්ෂාපෝෂිතව වගා කරන පැල්වත්ත හා ඇතිමලේ ප්‍රදේශවල දී එය කැපී පෙනෙන බැවින්, එම අඩුවීමට කාළගුණික සාධක යම් බලපෑමක් සිදුකරන්නට ඇතැයි අනුමාන කළ හැකිය. සෙවනගල කර්මාන්තශාලාව හැර අනෙක් සියලුම කර්මාන්තායතන සීනි උකහා ගැනීමේ ප්‍රතිශතය 2021 වසරට වඩා 2022 වසර තළ දී වර්ධනය කර ගැනීමට සමත් වී ඇත. 2022 වර්ෂයේ සමස්ත සීනි ආනයන ප්‍රමාණය 2021 වසර හා සසඳන කළ 21%ක පමණ අඩු වීමක් දක්නට ලැබුණ ද ආනයන වියදම රුපියල් බිලියන 83 දක්වා, 60%කින් පමණ වැඩිවී ඇත. රට තුළ පැවති විනිමය අර්බුදය හේතුවෙන් සීනි ආනයනය සීමා කිරීම හා දුඹුරු සීනි ආනයනය නැවැත්වීම නිසා සමස්ත ආනයන ප්‍රමාණය අඩු වුවද, රුපියල අවප්‍රමාණ වීම හා ලෝක සීනි මිල ඉහළ යාම නිසා වියදම වැඩිවී ඇත.

සීනි හා එතනෝල් ආනයන සීමා හේතුවෙන් ඒවාට ලැබෙන ඉහළ මිල හා ඉල්ලුම තවදුරටත් ස්ථාවරව පැවතිය හොත් 2023 වසරේ දී ද වැඩි සීනි හා එතනෝල් නිෂ්පාදනයක් අපේක්ෂා කළ හැකිය. උක් සඳහා ගොවීන්ට ගෙවන මිල සැලකිය යුතු ලෙස ඉහළ නැංවීම හේතුවෙන් ඔවුන් වැඩි වශයෙන් උක් වගාවට යොමුවීම ද මේ සඳහා පිටුවහලක් විය හැකිය.

# සීනි කර්මාන්තයේ කාර්යසාධනය 2017 - 2022

| | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 |
|---|---|---|---|---|---|---|
| දේශීය සීනි නිෂ්පාදනය (ටොන්) | 55,552 | 51,265 | 52,304 | 60,678 | 81,641 | 78,870 |
| සෙවනගල | 15,198 | 14,709 | 16,013 | 16,071 | 17,796 | 12,628 |
| පැල්වත්ත | 27,643 | 28,061 | 25,162 | 23,582 | 30,300 | 24,110 |
| ගල්ඔය | 12,711 | 8,495 | 11,129 | 20,790 | 22,628 | 28,567 |
| ඇතිමලේ | - | - | - | - | 10,917 | 13,565 |
| සීනි උකහා ගැනීම (Recovery %) | | | | | | |
| සෙවනගල | 7.67 | 6.59 | 6.90 | 6.57 | 5.90 | 5.34 |
| පැල්වත්ත | 7.30 | 7.55 | 7.61 | 7.30 | 6.70 | 7.03 |
| ගල්ඔය | 7.48 | 6.78 | 7.06 | 6.58 | 6.34 | 7.18 |
| ඇතිමලේ | - | - | - | - | 7.62 | 7.81 |
| වගාකරන ලද භූමි ප්‍රමාණය (හෙක්.) | 15,032 | 14,393 | 162,08 | 17,368 | 24,377 | 25,476 |
| සෙවනගල | 3,498 | 3,502 | 3,240 | 3,385 | 3,305 | 3,552 |
| පැල්වත්ත | 8,785 | 7,810 | 7,810 | 8,133 | 9,713 | 9,913 |
| ගල්ඔය | 2,749 | 3,081 | 5,158 | 5,850 | 6,570 | 6,837 |
| ඇතිමලේ | - | - | - | - | 4,789 | 5,174 |
| උක් අස්වැන්න (හෙක්. ටොන්) | | | | | | |
| සෙවනගල | වාරි-92, වර්ෂා-54 | වාරි-110, වර්ෂා-71 | වාරි-105, වර්ෂා-66 | වාරි-101, වර්ෂා-61 | වාරි-114, වර්ෂා-82 | වාරි- 110, වර්ෂා - 84 |
| පැල්වත්ත | 48 | 47 | 40 | 39 | 61 | 50 |
| ගල්ඔය | 63 | 52 | 67 | 54 | 65 | 53 |
| ඇතිමලේ | - | - | - | - | 50 | 40 |
| අඹරන ලද උක් දඬු ප්‍රමාණය (ටොන්) | 746,607 | 720,260 | 790,213 | 879,563 | 1,290,069 | 1,279,519 |
| සෙවනගල | 198,151 | 223,293 | 232,791 | 244,457 | 301,767 | 237,541 |
| පැල්වත්ත | 378,517 | 371,694 | 330,824 | 323,106 | 488,168 | 343,038 |
| ගල්ඔය | 169,939 | 125,273 | 226,598 | 312,000 | 356,647 | 397,751 |
| ඇතිමලේ | - | - | - | - | 143,487 | 176,599 |
| ENA නිෂ්පාදනය (ලීටර් මිලියන) | 7.00 | 13.00 | 12.50 | 14.40 | 20.12 | 21.63 |
| සෙවනගල | 3.30 | 4.20 | 2.20 | 3.30 | 5.10 | 3.90 |
| පැල්වත්ත | 3.70 | 5.50 | 5.60 | 5.50 | 7.96 | 7.88 |
| ගල්ඔය | - | 3.30 | 4.70 | 5.60 | 7.06 | 6.90 |
| ඇතිමලේ | - | - | - | - | - | 2.95 |
| සීනි ආනයන ප්‍රමාණය (ටොන්) | 498,000 | 645,000 | 556,000 | 683,000 | 582,000 | 460,000 |
| සීනි ආනයන වියදම (රු. බිලියන) | 39 | 40 | 36 | 51 | 52 | 83 |
| දේශීය සීනි අවශ්‍යතාව (ටොන්) | 553,552 | 696,265 | 603,804 | 743,678 | 663,641 | 538,870 |
| දේශීය අවශ්‍යතාවෙන් සීනි නිෂ්පාදන ප්‍රතිශතය (%) | 10 | 7.3 | 8.7 | 8.2 | 12.3 | 14.6 |




**උපදේශකත්වය**
තිස්ස සුනිල් රත්වත්ත - සභාපති
ආචාර්ය එම්. එස්. පෙරේරා - අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී

**සංස්කාරක මණ්ඩලය**
ඩී. පී. ඩබ්ලිව්. පොත්තවෙල - තාක්ෂණ සම්ප්‍රේෂණ නිලධාරී
කේ. ඒ. දිනේශ් කොඩිතුවක්කු - ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී
අමිල ප්‍රසාද් කරුණාතිලක - සංවර්ධන නිලධාරී
ඒ. එන්. එම්. බී. රසික ප්‍රභාත් - සංවර්ධන නිලධාරී

**පිටු සැකසුම හා නිර්මාණකරණය**
අමිල ප්‍රසාද් කරුණාතිලක - සංවර්ධන නිලධාරී

**ලිපි සහ තොරතුරු සැපයීමෙන් දායකත්වය**
ඩී. පී. ඩබ්ලිව් පොත්තවෙල - තාක්ෂණ සම්ප්‍රේෂණ නිලධාරී
කේ. ඒ. දිනේශ් කොඩිතුවක්කු - ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී
ආචාර්ය තිලංක ආරියවංශ - පර්යේෂණ නිලධාරී
ඩබ්ලිව්. පී. එම්. එස්. වේරගොඩ - සංවර්ධන නිලධාරී
අමිල ප්‍රසාද් කරුණාතිලක - සංවර්ධන නිලධාරී
ඒ. එන්. එම්. බී. රසික ප්‍රභාත් - සංවර්ධන නිලධාරී


**උක් කර්මාන්තයට අදාළ ලිපි සැපයීමෙන් පුවත් හසුන ඉදිරි කලාපයන් සඳහා ඔබට දායක විය හැකි අතර, එම ලිපි ලේඛන, ඔබගේ අදහස් හා යෝජනා පහත ලිපිනයට යොමු කරන්න.**


සංස්කාරක
පුවත් හසුන
උක් පර්යේෂණ ආයතනය
උඩවලව
ඊ මේල්: puwathhasunasri@gmail.com

**විමසීම්**
අධ්‍යක්ෂ, උක් පර්යේෂණ ආයතනය, උඩවලව
දුරකථන: 047 22 33281, 047 22 33285 ෆැක්ස්: 047 22 33233
ඊ මේල්: puwathhasunasri@gmail.com
වෙබ් අඩවිය: www.sugarres.lk


Follow us on


ප්‍රකාශනය - තාක්ෂණ හුවමාරු හා සංවර්ධන අංශය - උක් පර්යේෂණ ආයතනය